**නැගෙනහිර පළාතේ සහභාගිත්ව වෙරළාශ්‍රිත කලාප ප්‍රතිස්ථාපනය හා තිරසාර කළමනාකරණය පිළිබඳ පසු-සුනාමි ශ්‍රී ලංකා ව්‍යාපෘතිය -**

-----------------------------------------------------------------------------------------------------------

1. **මතය**

------

මාගේ පරීක්ෂණයෙන පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනයකර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙනයනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව්කර තිබුණු බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ ,

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2. **මල්‍ය ප්‍රකාශන**

-------------------

2.1 **මූල්‍ය කාර්ය සාධනය**

--------------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.49,373,305 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.86,083,214 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, 2010 සැප්තැම්බර් 10 සිට 2011 දෙසැම්බර් 31 දක්වා වියදම, 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| සංරචක | 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2010 සැප්තැම්බර් 10 සිට 2011 දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වියදම | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| තාක්ෂණ සහාය උපදේශකත්ව | 3,673,920 | 207,815 | 3,881,735 |
| පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය | 18,290,961 | 6,263,508 | 24,554,469 |
| හැඩගස්වා ගැනීම (Adaptation ) | 12,728,342 | 2,807,947 | 15,536,289 |
| වාහන හා උපකරණ | 8,462,530 | 17,645,185 | 26,107,715 |
| මෙහෙයුම් හා නඩත්තුව | 6,217,552 | 9,785,454 | 16,003,006 |
| එකතුව | 49,373,305 | 36,709,909 | 86,083,214 |

## 2.2 විශේෂ (ඩොලර්) ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගතහැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් හා 2012 දෙසැම්බර් 31 දිනට ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | එජඩො | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 171,125 | 19,491,407 |
| එකතුකළා :- හිලව් කිරීම | 500,000 | 66,892,500 |
| විදේශ විනිමය පාඩුව | - | (286,583) |
| | 671,125 | 86,097,324 |
| අඩුකළා :- ආපසු ගැනීම් | (349,360) | (45,181,418) |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 321,765 | 40,915,906 |

## 3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අදාළ ගනුදෙනුව නිම කළ වහාම ලබාගත් අත්තිකාරම් නිරවුල් කළයුතු වුවද අත්තිකාරම් 6 ක් සඳහා ලබාගත් එකතුව රු.601,200 කින් රු.194,045 ක මුදලක් මාස 2 සිට මාස 4 ක ප්‍රමාදයකින් පසුව ආපසු ගෙවා තිබුණි.

(ආ) හරිතාගාරය (Green House ) ඉදිකිරීම සඳහා වියදම ලෙස රු.500,000 ක මුදලක් ගිණුම් ගතකර තිබුණද, රු.36,064 ක මුදලක් උපයෝජනය කිරීමෙන් හෝ ව්‍යාපෘතියට ආපසු භාරදීමෙන් තොරව 2012 දෙසැම්බර් 31 දක්වා මඩකලපුව වාකරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පතු ගිණුමේ රඳවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) 2012 නොවැම්බර් 11 දින රු.150,000 ක මුදලක් සුළු - ණය ක්‍රියාකරකම් සඳහා වාකරේ කොමතලමඩු කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියට මුදාහැර තිබුණි. කෙසේ වුවද පුද්ගලයන් 10 දෙනෙකුට පමණක් රු.105,000 ක් ගෙවා තිබුණු අතර ඉතිරි රු.45,000 ක මුදල අරමුණු කළ කාර්යයන් සඳහා යොදාගැනීමෙන් තොරව කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියෙහි රඳවා ගෙන තිබුණි.

(ඈ) හදිසි ආපදා තතත්වයන් වළක්වාගැනීම සඳහා පවත්නා මාර්ගවල, ස්ථානවල හා සුනාමි බලපෑමට ලක්වියහැකි ප්‍රදේශවල සවි කිරීම සඳහා නාම පුවරු 91 ක් ආදේශ කිරීමට ව්‍යාපෘතිය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අතර 2012 ජුනි 06 දින අංක ජර්එෆ්/අයිඑෆ්ඩී/ටීආර්අයි/ ඩීඑම්සී /01 දරන ගිවිසුම අත්සන්කර තිබුණි. මෙම කාර්යය සඳහා රු.682,500 ක් ගෙවීමට ව්‍යාපෘතිය එකඟවී තිබුණු අතර රු.273,000 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. ගිවිසුම් කාලය අවසාන වී තිබුණද මෙම කාර්යය 2012 දෙසැම්බර් 31 දක්වා නිමකර නොතිබුණි.

(ඉ) කෝමාරි කලපුව ගැඹුරුකර හැරීමට රු.1,255,480 ක ඇස්තමේන්තුවක් ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරි විසින් පිළියෙලකර අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජනේරු විසින් අනුමත කර තිබුණි. කෙසේ වුවද මිණුම් පත්‍රිකාවලට අනුව තථ්‍ය වැඩ නිමකිරීම රු.1,088,472 ක් වූ අතර පොතුවිල් ප්‍රාදේශීය ලේකම්ට රු.1,255,480 ක ගෙවීමක් කර තිබුණි. රු.166,738 ක ඉතිරි මුදල 2012 දෙසැම්බර් 31 දක්වා ආපසු අයකර ගෙන නොතිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් හා වියදම් වර්ගීකරණය අතර වෙනස්කම් නිරීක්ෂණය වුවද, පහත විස්තර දැක්වෙන පරිදි එම වෙනස්කම් විමර්ශනය කර සසඳා නොතිබුණි.

| | මූල්‍ය ප්‍රකාශන වල සටහන් 02 අනුව | වියදම් වර්ගීකරණය අනුව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| මෝටර් වාහන හා උපකරණ | 8,462,530 | 8,637,011 | (174,481) |
| මෙහෙයුම් හා නඩත්තු | 6,217,552 | 6,043,071 | 174,481 |

**4. මූල්‍ය සහ භෞතික කාර්ය සාධනය**

**4.1 අරමුදල් උපයෝජනය**

2012 වර්ෂය සඳහා ශීර්ෂ 291 - නැගෙනහිර පළාත් සභාව යටතේ මුදල් රෙගුලාසි 66 මාරු කිරීමෙන් පසු රු.65,000,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. සලසන ලද ප්‍රතිපාදනය, දරන ලද වියදම හා උපයෝජනයේ ප්‍රතිශතය පහත දැක්වේ.

| සංරචක | මු.රෙ.66 මාරුකිරීම් යටතේ ඇස්මේන්තුගත ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | උපයෝජනයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| මූලධන වියදම (13) | 60,000,000 | 45,181,413 | 75.3 |
| පරිපාලන පිරිවැය හා බදු (17) | 5,000,000 | 2,108,220 | 42.1 |
| එකතුව | 65,000,000 | 47,289,633* | 73.7 |

* මෙම මුදල 2011 වර්ෂයට අදාළ රු.2,752,021 ක් වු වියදම් හා රු.109,679 ක් වු බැරකම් ඉවත් කිරීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදලින් වෙනස් වේ.

**4.2 භෞතික කාර්ය සාධනය**

විගණනයට ලබාගත හැකි වු 2012 වර්ෂය සඳහා වියදම් ප්‍රකාශයට අනුව 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාර්යයන් පිළිබඳ කාර්ය සාධනය පහත දැක්වේ.

(අ) පහත දැක්වෙන කාර්යයන් 2012 වර්ෂය තුළදී ක්‍රියාත්මකකර නොතිබුණි. එය ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් 22% ක් විය.

| කාර්යය අංකය | කාර්යය | ඇස්තමේන්තුගත පිරිවැය |
|---|---|---|
| | | රු.මිලියන |
| 1 | ඵලදායී ප්‍රතිස්ථාපනය හා තිරසාර කළමනාකරණය සඳහා විශිෂ්ට ව්‍යවහාරයන් | 10.2 |
| 2 | ඵලදායී පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය හා සංරක්ෂණ කළමනාකරණය | 16.7 |
| 3 | තිරසාර ජීවනෝපායයන් සහ දේශගුණික විපර්යාස පීඩාවන්ට හැඩගස්වා ගැනීම | 34.55 |
| | එකතුව | 61.45 |

(ආ) පහත දැක්වෙන කාර්යයන් පිළිබඳ ප්‍රගතිය 1% කට වඩා අඩු විය.

| කාර්යය අංකය | විස්තරය | ඇස්තමේන්තුව | තථ්‍ය කාර්යය නිමකිරීම | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| | | රු. | රු. | % |
| 1.1.2 | ප්‍රදර්ශන ස්ථාන ප්‍රතිස්ථාපනය සමඟ සහභාගීවන ප්‍රජාව සඳහා සමාජ ආර්ථික දත්ත යාවත්කාලීන කිරීම. | 6,000,000 | 39,780 | 0.6 |
| 1.1.3 ආ | ත්‍රිකුණාමලයේ, කන්නියා කඩොලාන කැලය පිළිබඳ සහභාගිත්ව කළමනාකරණය | 6,400,000 | 23,566 | 0.3 |
| 1.1.7 ආ | ප්‍රජාපාදක ආපදා අවදානම් කළමනාකරණය හා දේශගුණික විපර්යාස හැඩගැස්වීම් ආරම්භකයන් ක්‍රියාත්මකකිරීම සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට තාක්ෂණික පුහුණුව සැපයීම. | 1,000,000 | 2,000 | 0.2 |
| 2.3.1 | නැගෙනහිර පළාත සඳහා දේශගුණික විපර්යාස හැඩගැස්වීම් පිළිබඳ සුදානම්වීම හා ක්‍රියාත්මකකිරීම සඳහා සහාය. | 10,200,000 | 8,718 | 0.08 |

| | | | | |
|---|---|---|---|---|
| 3.2.1 | ප්‍රාදේශීය ප්‍රජාව හා වෙනත් ප්‍රධාන උනන්දුවක් දක්වන්නන්ගෙන් තොරතුරු ලබාගැනීමෙන්, සහ - කළමනාකරණ පදේශයේ මායිම් සමීක්ෂණය හා වෙන්කිරීම. | 5,000,000 | 20,250 | 0.4 |
| 3.2.3 අ | වාකරෙයිහි කැලෑබද උද්‍යානය ස්ථාපනය කිරීම. | 4,000,000 | 38,650 | 0.9 |
| 3.3.1 | ප්‍රාදේශීය ප්‍රජාව හා වෙනත් ප්‍රධාන උනන්දුවක් දක්වන්නන්ගෙන් තොරතුරු ලබාගැනීමෙන් සහ - කළමනාකරණ පදේශයේ මායිම් සමීක්ෂණය හා වෙන්කිරීම. | 5,000,000 | 30,000 | 0.6 |
| 3.3.5 | කළමනාකරණ සැලැසම පිළිබද ඵලදායිතාවය තක්සේරුකිරීම සඳහා කාලීන අධීක්ෂණය හා ඇගයීම භාරගැනීම හා අවශ්‍ය අවස්ථාවන්හි වෙනස්කම් සිදුකිරීම. | 500,000 | 3,500 | 0.7 |
| 3.3.4 | උද්‍යාන මායිම් වෙන්කිරීම සඳහා පහසුකම් සැපයීම හා ආගන්තුක පාලන පහසුකම් ස්ථාපිත කිරීම | 3,730,000 | 13,961 | 0.3 |
| | | ------------- | ----------- | --------- |
| | එකතුව | 41,830,000 | 156,859 | 0.379 |

## 5. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අත්තිකාරම් නිරවුල් කිරීම

(ආ) ගිණුම් වාර්තා පවත්වාගෙනයාම

(ඇ) නිවාඩු ලේඛනය පවත්වාගෙනයාම